# රෝහණ දේශයේ බෞද්ධ ජනතාවගේ දේව විශ්වාස පිළිබඳ විමර්ශනයක්

කාංචන ජනප්‍රිය[1]
ශානි නිශාන්ති[2]

ශ්‍රී ලංකාවේ ප්‍රධාන උපරාජ්‍යය ලෙස සැලකෙන රෝහන දේශය වර්තමානයේ දිවයිනේ දකුණු පළාතට කේන්ද්‍රව පැවති බව විශ්වාස කරයි. රෝහණයට අයත් ප්‍රදේශ රත්නපුර, මොනරාගල, අම්පාර වැනි දිස්ත්‍රික්කවලට පවා විහිද යයි. රෝහණ රාජ්‍ය ආරම්භ කළ "රෝහණ කුමරු" මහාවංශයේ දැක්වෙන පරිදි ඉන්දියාවේ ශාක්‍ය වංශයට අයත් භද්දකච්චායනා කුමරියගේ වැඩිමහල් සොහොයුරා වේ. රෝහණය මුල් ඓතිහාසික යුගයේ සිටම බෞද්ධ රාජ්‍යයක් ලෙසෙ පැවති බවට තොරතුරු හමුවේ. රෝහණ දේශයේ ඉතිහාසය බෞද්ධාගමික පසුබිමකින් වර්ධනය වී ඇති අතර අදාළ භූ කලාපයේ දේව විශ්වාසයද බහුලව ව්‍යාප්තව පවතී. රෝහණයේ භූගෝලීය සීමාව ආරම්භ වන කලු ගං මෝදර කාලි කෝවිලක් පැවති ඇති බව සාහිත්‍ය මූලාශ්‍රවල දක් වේ. සීනිගම දෙවොල් දෙවියන් රෝහණයේ සුප්‍රකට දේවතාවෙකි. මාතර උපුල්වන් දේවාලයට දිගු ඉතිහාසයක් ඇති අතර උපුල්වන් දෙවියන් ලංකාවම ආරක්ෂා කරන බව විශ්වාස කෙරේ. එමෙන්ම මාතර ගැටබරුව දෙවියන් හෙවත් බස්නාහිර දෙවියන්ද වන්දනයට පාත්‍ර වේ. හම්බන්තොට රත්මලේ අඩවියේ රත්මල් දෙවිඳු පුදපූජාවට ලක්කෙරෙන අතර රන්න, හුංගම ප්‍රදේශවල මංගර දෙවියන් පූජාවට ලක් වේ. කතරගම දෙවියන් මුළු ලක්දිවේම ජනයාගේ වන්දනයට ලක්වන අතර රෝහණයේ කොටබෝව, උග්ගල් අලුත්නුවර ආදී ප්‍රාදේශීය දේවාලවලද වැඳුම් පිදුම් වලට පාත්‍ර වේ. සුමන සමන් දෙවියන් ශ්‍රී පාද සමනළ අවධියේ බෞද්ධ දෙවියන් වන අතර ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රදේශයේ සිංහරාජය අවට ජනයා පවා අදාළ වනාන්තරවල සමන් දෙවියන්ගේ අණසක පවතින බව විශ්වාස කරයි. මහියංගන ප්‍රදේශය සමන් දෙවියන්ගේ සොහොයුරිය වන "මහලොකුවෝ" නම් දේවතාවට අයත් බව විශ්වාස කරනු ලැබේ. රෝහණයේ ප්‍රාදේශීය සිටි පාලකයින් බෞද්ධ දේවත්වයෙන් පිදුම් ලැබූ බව කතරගම මහසෙන් හා නමුණුකුල ඉන්දක දේව විශ්වාසයෙන් ප්‍රකට වේ. එමෙන්ම ගණ දෙවියන්, විෂ්ණු දෙවියන්, කඩවර දෙවියන්, ගම්භාර දෙවියන්, ඊශ්වර දෙවියන් වෙනුවෙන් දේවාල හා දේව විශ්වාස රුහුණේ දැකිය හැකි වේ. වල්ලිමාතා, සරස්වති, පත්තිනි, ලක්ෂමී වැනි දේවතාවියන් ද රුහුණේ වන්දනයට ලක් වේ. අවලෝකිතේශ්වර නාථ වැනි බෝධි සත්ව දෙවිවරු ද රෝහණයේ වන්දනයට පාත්‍ර වූ බවට සාක්ෂි හමු වේ. පෞරාණික රෝහණ දේශයේ බෞද්ධ ජනතාව විවිධ අවශ්‍යතා සඳහා පෙරකී දේව විශ්වාසවල එල්ඹ සිටින බව දැකිය හැකි වේ. රෝහණ රාජ්‍යය බහුදේව ඇදහිලි හා විශ්වාසවලින් පෝෂණය වූ ප්‍රදේශයක් බව පැහැදිලිව හඳුනාගත හැකි විය. ක්ෂේත්‍ර අධ්‍යයන හා සාහිත්‍ය විමර්ශන මඟින් හඳුනාගත් තොරතුරු අනුව රෝහණයේ බෞද්ධ ජනතාවගේ දේව විශ්වාස පිටුපස බෞද්ධාගමික බැඳියාවන් හා විශ්වාස පවතින බව හඳුනාගත හැකි වේ.

**ප්‍රමුඛ පදඃ** රෝහණ දේශය, දේව විශ්වාස, බෞද්ධ ජනතාව, ඇදහිලි, පුද පූජා.

---

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
2 ස්වාධීන පර්යේෂිකා